ශ්‍රී ජයවර්ධනපුර කලාපය
මධ්‍ය වාර පරීක්ෂණය - 2014

සිංහල භාෂාව හා සාහිත්‍යය
8 වන ශ්‍රේණිය

නම/ විභාග අංකය ........................................ කාලය පැය 2යි

❖ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටමත් දෙවන කොටසේ 1 හා 2 ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න 05කටත් පිළිතුරු සැපයිය යුතුවේ.

## I කොටස

★ දී ඇති පිළිතුරු අතරින් වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදූ විට " පරි........ණක සා ...... මාලාව" යන්නෙහි හිස්තැනට යෙදෙන අකුරු වනුයේ,

i) ස හා ට යි ii) ස හා ඨ යි iii) ග හා ට යි iv) ග හා ඨ යි

2) මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුණු වචනය කුමක් ද?

i) ප්‍රශ්නය ii) ස්ථිර iii) භයානක iv) ශ්‍රේෂ්ඨ

3) දේශන, විශේෂ, සුජීව යන පදවල ඉරි ඇඳි අකුරු හඳුන්වන නම් පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

i) මූර්ධජ, තාලුජ, දන්තජ ii) තාලුජ, දන්තජ, මූර්ධජ
iii) මූර්ධජ, දන්තජ, තාලුජ iv) තාලුජ, මූර්ධජ, දන්තජ

4) .................... මාමා ........................ දෙස බලමින් කල්පනා කරන්නට විය.
මෙම වාක්‍යයේ හිස්තැනට යෙදෙන වචන පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
i) අඹර, අබර ii) අබර, අඹර

5) පහත දැක්වෙන පේළිවලින් සඤ්ඤක අකුරක් නොයෙදුණු වචනයක් ඇතුළත් පේළිය තෝරන්න.
i) අඹ, කඳ, රඟ ii) අඟ, හඬ, අඹර
iii) නුබ, හඳ, හොඬ iv) කඹ, අඟන, දඬුව

★ පහත දැක්වෙන ඉඟිවැකිවල අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

6) කට්ට කරුවලේ
i) තද වැසි ඇති ii) තද කළු පාටැති
iii) ඝන අන්ධකාරයේ iv) රාත්‍රී කාලයේ

7) උරවක්‍ර මාලාවක්
i) උරයේ දමන මාලයක් ii) මිදිය නොහැකි කරදරයක්
iii) උරයේ වක්‍රයක් යෙදීම iv) විඳීමට අපහසු වේදනාවක්

8) රටක් ජාතියක් හැම කෙනෙකුට ම උරුම වී ඇත. මෙහි ජාතියක් යන්නට සමාන පදයකි.

i) බස ii) දෙස iii) රුස iv) සමය

9) "වෙහෙස" යන්නට සමාන පදයක් නොවන්නේ.

i) සරතැස ය ii) විඩා ය iii) ගිම් ය iv) ප්‍රයත්නය ය

10) " යහපත් " යන අර්ථය දෙන බහු අර්ථවත් පදයකි.

i) වන ii) දිය iii) සත් iv) නා

11) " සඳ" යන බහු අර්ථවත් පදයේ අර්ථයකි.

i) උතුම් ii) ලෝකය iii) යහළුවා iv) පාදය

12) ඔබ මොබ යන පද දෙක අර්ථයෙන් එකිනෙකට

i) විරුද්ධ ය ii) සමාන ය iii) වෙනස් ය iv) වැඩි ය

13) යුගල පදයක් නොවන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i) කටවහ ii) යානවාහන iii) සිරිත්විරිත් iv) යාම්ඊම්

★ පහත 14-15 වාක්‍යවල ඉරි ඇඳි පද හඳුන්වන ක්‍රියා පද තෝරන්න.

14) නිළිය රඟුම් <u>පාමින්</u> ප්‍රේක්ෂකයින් පිනවයි.

i) විධි ක්‍රියාවකි ii) අසම්භාව්‍ය ක්‍රියාවකි iii) පූර්ව ක්‍රියාවකි
iv) මිශ්‍ර ක්‍රියාවකි

15) පාලකයා සේවකයන් ලවා කාර්යාල පරිශ්‍රය පිරිසිදු <u>කරවයි</u>.

i) ප්‍රයෝජ්‍ය ක්‍රියා පදයකි ii) පූර්ව ක්‍රියා පදයකි iii) මිශ්‍ර ක්‍රියා පදයකි
iv) විධි ක්‍රියා පදයකි

★ 16 හා 17 ප්‍රශ්නවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය අනුව ගැළපෙන පද තෝරන්න.

16) .................................................. නිදහසේ වනයේ සැරිසරති.

i) වන සත්තු ii) වන සතුන් iii) වන සතෙක්
iv) වන සතෙකු

17) නදී තොමෝ මුහුදට ගලා ..................................................

i) බසිති ii) බසින්නේ ය iii) බැස්සේ ය. iv) බසියි

18) " ඕජ්යජ" යනු.

i) තනි පදයකි ii) උක්ත පදයකි iii) බහු අර්ථවත් පදයකි iv) නාම මූලයකි

19) "පරිස්සමට තබන දෙයක් නුසුදුසු තැනක තැබීම" යන්නට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

i) බූරුවාගේ පිටේ ලුණු පැටෙව්වා වාගේ
ii) වක්කඩේ හකුරු හැංගුවා වාගේ
iii) ඉඟුරු දී මිරිස් ගත්තා වාගේ
iv) බලු වලිගේ බැඳපු මීය වාගේ

20) " වැඩිවේ නුවණ දින දින පුර සඳ ලෙසිනී" යන කවි පදයේ දැක්වෙන උපමාව තෝරන්න.

i) නුවණ ii) දින දින iii) පුර සඳ iv) වැඩි

(ලකුණු 2×20 = 40)

සිංහල භාෂාව හා සාහිත්‍යය
8 වන ශ්‍රේණිය
II කොටස

❖ මෙහි 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් කැමති 03 කට පිළිතුරු සපයන්න.

(1) ඔබ පන්ති කාමරයේ සිදු කළ " රසවින්දන කවය" ක්‍රියාකාරකම ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) ක්‍රියාකාරකම ලෙස යොදා ගත් ගී වර්ග දෙකක් ලියන්න. (ලකුණු 2)

ii) ක්‍රියාකාරකමේ යෙදීමට පෙර ගුරුවරයාගෙන් ඔබට ලැබුණ උපදෙස් 3ක් ලියන්න. (ලකුණු 3)

iii) ඔබේ කණ්ඩායම ක්‍රියාකාරකමට සූදානම් වූයේ කෙසේ ද? (ලකුණු 3)

iv) මෙම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යෙදීමෙන් ඔබ ලබාගත් හැකියාවන් 3ක් ලියන්න. (ලකුණු 3)

v) ක්‍රියාකාරකම අතරතුරදී ඔබට පැන නැගුණු ගැටලුවක් ලියා එය මගහරවා ගත් ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(මුළු ලකුණු:16)

(2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200කට නො අඩු රචනාවක් ලියන්න.

i) ලොව මවිත කළ අපේ උරුමයන්

ii) උගත මනා ශිල්පය මැයි මතු රැකෙනා

iii) සුන්දර පරිසරය ගෙනෙයි නෙක අසිරිය

iv) දෙස බස රැස එළිය කළ අපේ සාහිත්‍යකරුවෙක්

(ල:14)

(3) පහත සඳහන් පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇත එපිට කඳුකරයෙන්
උඹ පාසල වෙත එන විට
කවුදෝ හිනැහුනත් උඹේ
මිරිවැඩි නැති පා දැකලා

උඹේ දෙපා ගැටුණු විගස
කඳු හෙල් වැටි ගුරු පාරේ
දෙපතුල් නොරිදෙන විලසේ
වැලි කැට බිම සැඟවිලා

ඉඳ හිට රිදුනත් පා යුග
සක්පා පිළිගන්නා ලෙස
බලන් නගේ පලසක් සේ
නිල් උඳුපියලිය වැව්ලා

i) මින් කියැවෙන අවස්ථාව කුමක් ද ?

ii) සොබා දහමින් නඟාට ලැබෙන ආශිර්වාද 2ක් ලියන්න

iii) " සකපා පිළිගන්නා ලෙස" යන්නෙහි අර්ථය ලියන්න.

iv) මෙහි එන උපමාව හා උපමේය වෙන් වෙන් ව ලියන්න.

v) මෙම පදවල තේරුම ලියන්න.

(4) පුනරුත්ථාපන කඳවුරක සිටින නාය යාමකින් අනාථවූවන් වෙනුවෙන් දිවා ආහාර වේලක් පිරිනැමීමට ඔබ පාසලේ බෞද්ධ සංගමය තීරණය කර ඇත. ඒ පිළිබඳ තොරතුරු විමසමින් එම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලිපිය සකස් කරන්න.

(ල:2×5 =10)

(5) "දෙවි දහම් දන්නා නියාත් එහි පවත්නා නියාත් යහපතැ"

1/ I. මෙය කීවේ කවුරුන් ද?
ii. මෙය කීවේ කා හට ද?
iii. කිව්වේ කිනම් වේලාවක ද?
iv. මෙම කතාව ඇතුළත් මුල් කෘතිය ලියන්න.
v. එහි කතුවරයා කවුරුන් ද?

11/ කන්දට කෙන්දට කොන්දට හුරු වී
නන්වන් අත හුරු වී
..............................................................
..............................................................

I. මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කර ලියන්න.
ii. මෙම පද්‍ය පන්තියේ රචකයාගේ නම ලියන්න.
iii. එතුමාගේ වෙනත් නිර්මාණ 2 ක් ලියන්න.
iv. නන්වන් යනුවෙන් කුමක් අදහස් කෙරේ ද?
v. මෙය කිනම් ගී විශේෂයකට අයත් දැයි ඔබ සිතන්නේ ද?

(ල:1×10 =10)

(6) මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

I. කුමාරතුංග මුනිදාස මහතාගේ ළමා කතා පොත් දෙකක්
ii. පැන විසඳුම් පාඩම උපුටාගත් මුල් කෘතිය හා එහි රචකයා නම් කරන්න.
iii. සිරි රාහුල හිමියන් නිර්මාණය කළ කවි පොත් 2 ලියන්න.
iv. මැණියන් එනතුරා නාට්‍යයේ ප්‍රධාන චරිත දෙකක් ලියන්න.
v. පන්සිය පනස් ජාතක පොත පරිවර්තනය වූයේ කිනම් යුගයේ ද ? කවුරුන් විසින් ද?

(ල:2×5 =10)

(7) පහත දැක්වෙන පදවල අර්ථ ලියා දක්වන්න.

| | |
|---|---|
| I) රැන මාල්ලක් | ii) පරිගෘහීත |
| iii) ග්‍රාම සූකර | iv) මලුක්කම |
| v) වාගාලාප | vi) පරසිඳු |
| vii) බිලියෙක | viii) කරුහවුල |
| ix) දෙබෑයන් | x) සක්වළ |

(ල:1×10 =10)